# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,475 - 2006 දෙසැම්බර් 08 වැනි සිකුරාදා - 2006.12.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1572 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1572 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1574 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1574 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 දෙසැම්බර් මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 දෙසැම්බර් මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## මහජන බැංකුව - කලාප කාර්යාලය (බටහිර 01)

### වටිනා දේපලක් විකිණීම

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ කොළඹ ආදායම් පාලක නිලධාරී (ඩී. ආර්. ඕ.) කොට්ඨාසය ඇතුළත, කොළඹ මහ නගර සභා සීමාවේ, නාගරික කොට්ඨාස අංක 38, බම්බලපිටියේ පිහිටි ඇල්ප්‍රඩ් පෙදෙසේ වරිපනම් අංක 39 2/2 දරන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ, නිදන කාමර 2 ක යුනිට් 8 වශයෙන් ලකුණු කොට දක්වා ඇති නිවාස පරිශ්‍රය,

*ගමන් මාර්ගය.–* අංක 45, ඇල්ප්‍රඩ් පෙදෙස සහ අංක 56, 58 තර්ස්ටන් පාරේ පිහිටි, 39 2/2 දරන පියසන් කෝට් ගොඩනැගිල්ලේ දෙවන මහලේ පිහිටි අංක 8 දරන නිවාස ඒකකය.

බටහිර කලාප 01 කලාප කාර්යාලයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් ලබාගෙන එය 2006.12.12 දින ප. ව. 2.45 ට හෝ ඉන් පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

සහකාර සාමාන්‍යාධිකාරී, බටහිර කලාප 01, මහජන බැංකුව, කලාප කාර්යාලය, අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.

එසේ නැතහොත්, කලාප කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2006.12.12 දින ප. ව. 2.45 ට පෙර බහාලිය යුතුය. ටෙන්ඩර් අයදුම්පත් 2006.12.12 දින ප. ව. 2.45 දක්වා කලාප කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා රු. 1,000ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් අය කරනු ලැබේ.

2006.12.12 දින ප. ව. 2.45 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට මෙම අවස්ථාවට සහභාගි විය හැක. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් මිළෙන් 10% ක් එදිනට ආදිපාද වීදිය ශාඛාව වෙත ගෙවිය යුතු අතර, ඉතිරි 90% ක මුදල දින 30ක් ඇතුළත සම්පූර්ණයෙන් ම ගෙවීමට ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් ඔහු විසින් ගෙවීම් කොට ඇති 10%ක මුදල ආපසු ගෙවනු නොලැබේ.

කිසියම් ටෙන්ඩර් අයදුම්පතක් හෝ සියලුම ටෙන්ඩර් අයදුම්පත් මුදල් තැන්පත් කිරීමට පෙර හෝ පසුව පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මහජන බැංකුව, බටහිර කලාප 01 කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී සතු වේ.

*විමසීම්.–* සහකාර සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව, කලාප කාර්යාලය (බටහිර 1), අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.

දුරකථන අංක : 2387068, 2327848, 2393678.

12-366

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහාධිකරණය - හලාවත

### හලාවත මහාධිකරණයේ හා හලාවත මහාධිකරණ විනිසුරු නිල නිවාසය අළුත් වැඩියාවෙන් පසු ඉවත් කරන ලද පැරණි ලී දඬු හා අබලි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2006.12.23 වැනි සෙනසුරාදා පෙ. ව. 9.30 ට හලාවත මහාධිකරණ භූමියේ දී හා හලාවත මහාධිකරණ විනිසුරු නිල නිවාස භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පවත්වන දින පෙ. ව. 9.00 සිට 9.30 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව පිළි නොගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම් කළ යුතුය. මුදල් ඇණවුම් චෙක්පත් භාර නොගන්නා අතර එදින පස්වරු 4.00 ට ප්‍රථම සියලුම භාණ්ඩ අධිකරණ භූමියෙන් හා මහාධිකරණ විනිසුරු නිල නිවාස භූමියෙන් ඉවත් කරගත යුතු වේ.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

එච්. සී. ජේ. මඩවල,
වයඹ පළාත් මහාධිකරණ විනිසුරු,
හලාවත.

2006 නොවැම්බර් මස 22 වැනි දින,
හලාවත මහාධිකරණයේ දී ය.

### උපලේඛනය

| *අනු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|
| (1) | රීප්ප දික් අඩි 1771ක් |
| (2) | අඩි 4.10 x 2.6 දොර පියන් 01යි (දිරාපත්ව ඇත) |
| (3) | අඩි 5.11 x 2.7 දොර පියන් 01යි (භාවිතයට ගත නොහැකි ලෙස දිරා ඇත) |
| (4) | අඩි 6.2 x 1.7 දැල් සහිත දොර පියන් 02යි |
| (5) | උස අඩි 6.9 x පළල 5.9 යකඩ කූරු සහිත ජනෙල් පියන් භාගයක් සමග ජනෙල් 01යි |
| (6) | දිග අඩි 3' x 2 . 3" දැල් කෑලි 22යි (මළ බැඳී ඇත) |
| (7) | දිග අඩි 10' .6" x 2'.3" දැල් කෑලි 01යි |
| (8) | කම්බි කූරු සහිත ජනෙල් අඩි 5'.6'' x 6' 01යි |
| (9) | අහල් 4 එස්ලෝන් බට දික් අඩි 206යි |

| අනු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|
| (10) | අහල් 01 හා විවිධ ප්‍රමාණ බට දික් අඩි 73 යි |
| (11) | අඩි 8 x 2 1/2 දිරා ගිය තහඩු 05යි |
| (12) | පොත් රාක්ක දිග අඩි 11.5 x 3. 3 x 4.6 04යි |
| (13) | දිග අඩි 11 x 1 .6 x 7 පොත් රාක්ක 01යි. (තරමක් දිරා ඇත) |
| (14) | දර යාර 03යි |
| (15) | දිග අඩි 16 1/2 මුල විශ්කම්භය අඩි 4යි. අග විශ්කම්භය 2.6 ඉන්දියන් විලෝ ගස් කඳන් 01යි |
| (16) | උඩට වීදුරු ගැසූ 5' 10' x 5'.6'' පාටිෂන් රාමු 01යි |
| (17) | උඩට වීදුරු ගැසූ අඩි 3'.6" x 5' 10" පාටිෂන් රාමු 01යි (දැව දිරා ඇත) |
| (18) | පැරණි අබලන් ගේට්ටු 01යි |
| (19) | කැඩුණු පුටු 13යි (කැබලි) |
| (20) | සිර මැදිරි (ප්‍රාථමික අධිකරණය - වෙන්නප්පුව) 01යි |
| (21) | සාක්ෂි කූඩු එම 01යි |
| (22) | විනිශ්චයාසනය එම 01යි |
| (23) | දිග අඩි 8 x 3 දිරා ගිය තහඩු 03යි |
| (24) | දිග අඩි 5 පළල 3' .6" ජනෙල් රාමු 03යි |
| (25) | දිග අඩි 5 පළල අඩි 4 ජනෙල් රාමු 02යි |
| (27) | දිග අඩි 4 පළල අඩි 4 ජනෙල් රාමු 02යි |
| (28) | උළුවහු රාමු දිග අඩි 7'.4" පළල අඩි 4යි 01යි |
| (29) | දිග අඩි 9'. 6" පළල අඩි 4 උළුවහු රාමු 01යි |
| (30) | දිග අඩි 7'.6" පළල අඩි 3'.6" උළුවහු රාමු 01යි |
| (31) | උළුවහු පලු 03 දිග අඩි 7'.5" පළල අඩි 7'.2" 01යි |
| (32) | දිග අඩි 6'.4'' පළල අඩි 2'.10" කලත්ප දොර 02යි |
| (33) | දිග අඩි 7'.4'' පළල අඩි 1'.7" වීදුරු දොර පියන් 08යි |
| (34) | දිග අඩි 7''. 4" පළල අඩි 1'.3" වීදුරු දොර පියන් 02යි |
| (35) | දිග අඩි 4'.7" පළල අඩි 2'.1" වීදුරු ජනෙල් පියන් 02යි |
| (36) | දිග අඩි 4'.7" පළල අඩි 1'.9" වීදුරු ජනෙල් පියන් 15යි |
| (37) | දිග අඩි 3'. 6" පළල අඩි 2 වීදුරු ජනෙල් පියන් 01යි |
| (38) | උස අඩි 4 පළල 2'.6" වීදුරු ජනෙල් පියන් 01යි |
| (39) | දිග අඩි 3'.7" පළල අඩි 1'. 9" වීදුරු ජනෙල් පියන් 06යි |
| (40) | දිග අඩි 7 පළල අඩි 2 වීදුරු ජනෙල් පියන් 02යි |
| (41) | දිග අඩි 6' .2" පළල අඩි 2'. 6" දිරාගිය ටෙලිස් (ලැටිස්) 04යි |
| (42) | දිග 3'.7" පළල 1'.3" ජනෙල් පියන් වීදුරු 10යි |
| (43) | දිග 3'. 6" පළල 2'. 4" වීදුරු ජනෙල් පියන් 08යි |
| (44) | පියන් සහිත රවුම් ජනෙල් රාමු පළල අහල් 38–01යි |
| (45) | විශ්කම්භය අඩි 2'.10" රවුම් ජනෙල් පියන් 01යි |
| (46) | උස අඩි 3'. 9" පළල අඩි 1''.3" කලත්ප ජනෙල් පියන් 02යි |
| (47) | දිග අඩි 10'. 11" පළල අහල් 10 අබලන් ලෑලි 20යි (දිග අඩු සහ වැඩි ප්‍රමාණ වලින් ඇත) |
| (48) | දිග අඩි 3'. 8" පළල අහල් 8 අබලන් ලෑලි කැබලි (විවිධ ප්‍රමාණවලින් ඇත) 19යි |
| (49) | අබලන් පරාල දිග අඩි 8'. 5" පළල 5'.3" සහ ඊට අඩු වැඩි ප්‍රමාණවලින් ඇති කැබලි 25යි |
| (50) | දිග අඩි 2'.8" පළල 4" x 2" අබලන් පරාල කැබලි 34යි |
| (51) | මෝල්ඩින් සහ බිඩින් දිග අඩි 5 කැබලි අහල් 2 1/2 දිග අඩු සහ වැඩි 24යි |
| (52) | දිග අඩි 6 පළල අඩි 3'. 8" ජී. අයි. බටවලින් සෑදූ ගේට්ටු පියන් 04යි |
| (53) | දිරූ යකඩ ගේඩර් දිග අඩි 9'. 4" 06යි |
| (54) | ඉවත් කරන ලද එස්ලෝන් පී. වී. සී. වැහි පිහිලි සහ බට ගොඩක් |
| (55) | ඉවත් කරන ලද කුස්සියේ පාවිච්චි කරන ලද සෙරමික් සින්ක් 01යි |
| (56) | අබලන් යතුරු තහඩු 03යි |
| (57) | දිරා ගිය විදුලි උපාංග එම්ඊඑම් මේන් ස්විච් අබලන් 03යි |
| (58) | ඩී බෝඩ් අබලන් 02යි |
| (59) | ෆෑන් රෙගුලේටර් අබලන් 05යි |
| (60) | අබලන් ටයර් කැබලි හා ස්විච් ගොඩක් |
| (61) | අබලන් ඌෂා විදුලි පංකා 04යි |
| (62) | අබලන් යකඩ බාත් ටබ් 02යි |
| (63) | ප්ලාස්ටික් සිස්ටන් 02යි |
| (64) | සෙරමික් සිස්ටන් 02යි |
| (65) | සෙරමික් වොෂ් බේසන් 02යි |
| (66) | ඉතාම අබලන් වූ සෙරමික් කොමෝඩ් 03යි |
| (67) | අබලන් ඇස්බැස්ටස් ෂීට් කැබලි 08යි |
| (68) | අබලන් උළු 3450යි |
| (69) | දිග අඩි 10'. 9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01යි |
| (70) | දිග අඩි 10'. 9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01යි |
| (71) | දිග අඩි 10'. 9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01යි |
| (72) | දිග අඩි 10'. 9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01යි |
| (73) | දිග අඩි 10'. 9'' පළල අඩි 2'.6'' අබලන් රාක්ක 01යි |
| (74) | දිග අඩි 10'. 9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01යි |
| (75) | අබලන් සිවිලිත් විදුලි පංකා 03යි |
| (76) | අබලන් විදුලි පංකා 03යි (හලාවත මහාධිකරණයේ) |

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගාල්ල, දංගෙදර, ගොරකගහවත්ත, අංක 44 දරන ස්ථානයේ පදිංචි, හෙට්ටිගොඩ ලියනදුරගේ සෝමසිරි වන මා, මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් පී. කේ. එල්. බණ්ඩාර මහතා ලියා සහතික වර්ෂ 1999ක් වූ ජුනි මස 17 වැනි දිනැති අංක 3832 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ගාල්ල, දංගෙදර ගොරකගහවත්ත, අංක 44 හි පදිංචි, හෙට්ටිගොඩ ලියනදුරගේ සුමනාවතී වෙත දෙන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරනු ලබන බව ද මින් පසු එම ඇටෝර්නි බලපත්‍රය කිසිදු බලපැවැත්මක් නොමැති බව ද සියල්ලෝ ම මෙයින් දැනගනිත්වා.

හෙට්ටිගොඩ ලියනදුරගේ සෝමසිරි.

12-250

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පන්නිපිටිය, හිරිපිටිය, අංක 179/ඩී/1 හි පදිංචි කුලසූරිය ආරච්චිගේ චමින්ද ශිරාන් පෙරේරා වන මම සියල්ලන්ගේම දැන ගැනීම පිණිස දන්වා සිටින වග නම්,

හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස් එස්. දිසානායක මහතා විසින් ලියා සහතික කරන ලද අංක 12530 හා වර්ෂ 2004.01.14 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් ඉහත කී ලිපිනයේ පදිංචි පල්ලිගොඩ විතානගේ නන්දාවතී මහත්මිය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කර තිබූ අතර, එම ඇටර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගේ අංක 280/40/8381 හි ලියා පදිංචි කර ඇත. එකී ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රතික්ෂේප කරන ලද බවත්, එකී ලේඛනය මෙතැන් පටන් කිසිදු බල පැවැත්වීමක් නොවන බවත්, සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

කුලසූරිය ආරච්චිගේ චමින්ද ශිරාන් පෙරේරා.

2006, නොවැම්බර් මස 20 වැනි දින.

12-373

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වැළඩ පරගහදෙනියේ වී. සී. නිවාස අංක 9 හි පදිංචි මොහමඩ් හනීෆා මොහමඩ් ෆාරිස් වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයකු වශයෙන් ඇතුළු වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වැනි අධිකාරියේ 07 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

එම්. එච්. එම්. පාරිස්,
ප්‍රතිඥාත නොතාරිස් ලිපිකරු.

2006 ජුනි මස 27 වැනි දින,
අංක 9 වී. සී. නිවාස, පරගහදෙනිය,
වැළඩ.

12-284

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මීනුවන්ගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කිව්. ටී. තිසේරා විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද 2001.09.06 දින සහ අංක 2840 දරන බැඳුම්කරය යටතේ සහ 2002.05.10 දින සහ අංක 3056 දරන බැඳුම්කරය යටතේ සහ එදිනම අංක 3057 දරන ලේඛනය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම නන්ඊදිනිගේ සරත් තිලකසිරි සහ නන්ඊදිනිගේ ඉන්ද්‍රානි ජයලත් ණයකරුවන් හැටියට පැහැර හැර ඇත.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලු මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2006ක් දෙසැම්බර් මස 22 වැනි දින ප. ව. 3.00 ඇරඹෙන පරිදි එකී ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ) අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ වේගොව්වේ පිහිටි පිල්ලෑවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කරනු ලැබූ බලයලත් මානක ඒ. සී. එස්. ගුණරත්න විසින් මැන සාදනු ලැබූ 1959.09.09 දින සහ අංක 3898/පී දරන පිඹුරෙහි ලොට් "ඒ" ලෙස දක්වා ඇති ඉඩම් කොටස වේ.

ප්‍රමාණය - රූඩ් 01 පර්චස් 9.06.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.04.15 වැනි දින *ගැසට්* පත්‍රය ද, 2005.05.03 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ විගස සාර්ථක ගැණුම්කරු විසින් එවලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදලින් 10%ක් ද,
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2ක් ද,
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව සහ අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000ක් ද වේ.

වෙන්දේසි දින සිට වැඩකරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය.

අදාළ ඔප්පු සහ අනිකුත් ලියවිලි පරීක්ෂා කිරීම, හා වෙනත් අදාළ තොරතුරු සඳහා විමසන්න. කළමණාකරු, මීනුවන්ගොඩ ශාඛාව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 41, සමරක්කොඩි පාර, මීනුවන්ගොඩ. දුරකථන අංක : 2297377, 2296882 හෝ ප්‍රධාන කළමණාකරු (ණය අධීක්ෂණ හා අයකිරීම් මධ්‍යස්ථානය), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු,
අධිකරණ හා වාණිජ බැංකු අවසරලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු, භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ,
2810145,
0777-212602.

12-383/1

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - ගම්පහ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

### අගනා ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද, 1998.09.11, 2000.06.08 සහ 2002.10.30 දින සහ පිළිවෙලින් අංක 16517, 18536 සහ 20567 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සාරනාවිට පටබැඳිගේ ප්‍රේමදාස, සේනානායක, අමරසිංහ මොහොට්ටි අප්පුහාමිලාගේ රූපිකා චිත්‍රාංගනී සහ ජයකොඩි මොහොට්ටි අප්පුහාමිලාගේ සීලවතී ජයකොඩි ණයකරුවන් හැටියට පැහැර හැර ඇත.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2006 දෙසැම්බර් මස 22 වැනි දින ප. ව. 10.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ මැද පත්තුවේ කුඹුරුගොඩ ගමෙහි පිහිටි කෝන්ගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට බලයලත් මානක ජී. ජයකොඩි විසින් මැන සාදන ලද 1989.02.23 දිනැති අංක 2294 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද කැබලි අංක 04 ලෙස නිරූපිත ඉඩම් කොටස විශාලත්වය පර්චස් 32.1.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.03.10 දින *ගැසට් පත්‍රය* ද, 2006.03.22 දින දිවයින, අයිලන්ඩ් හා තිනකරන් යන පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසාන වූ විගස සාර්ථක ගැණුම්කරු විසින් එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

(1) ගැණුම් මුදලින් 10%ක් ද,
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 .5 ක් ද,
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව සහ අනෙකුත් ගාස්තු ද,
(5) සෝෂක ගාස්තු රු. 500ක් ද,
(6) විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000ක් ද වේ.

වෙන්දේසිය දින සිට වැඩකරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු සඳහා විමසන්න :

කළමණාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, ගම්පහ ශාඛාව, දුරකථන අංක : 033-2225597, 033-2222520 හෝ ප්‍රධාන කළමණාකරු (ණය අධීක්ෂණ හා අයකිරීම් මධ්‍යස්ථානය), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10).

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු,
අධිකරණ හා වාණිජ බැංකු අවසරලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු, භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ,
දුරකථන අංක : 2810145, 0777-212602.

12-383/2

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

කෙන්ට් ගාමන්ට්-ගිණුම් අංකය : 0035 1000 2929.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.01 වැනි දින යෝජනා කොට සම්මත කර ගනු ලැබ 2006.03.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2006.02.06 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහනව ලක්ෂ දෙදහස් පන්සිය විසිඅටකුත් ශත තිස්හතරක (රු. 19,02,528.34) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් දාහත්ලක්ෂ අසූ අට දහස් තුන්සියයක (රු. 17,88,300) මුදල සඳහා වසරකට සියයට නවයයි දශම පහ (9.5%) බැගින් 2005 මාර්තු මස 01 වැනි දා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අය කිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2006.12.28 දින පෙ. ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර හා මහ නගර සභා සීමාව ඇතුළත මා ඉටිපේ ග්‍රාමයේ පිහිටි කපුලන්දකුඹුර නමැති ඉඩමේ ලොට් අංක 13 හි ලොට් අංක 13 බී වශයෙන් ලකුණු කොට ඇති බිම් කොටසේ ලොට් අංක 13 බී 1 වශයෙන් ලකුණු කොට ඇති බලයලත් මිනින්දෝරු ඒ. ඩී. ඒ. ගුණසේකර විසින් සාදන ලද 2004 ජූනි මස 21 දාතම හා අංක 3251 පිඹුරට අනුව උතුරට : ඇත්තිලිගොඩ ශ්‍රී සුගතපාල මාවත ද, නැගෙනහිරට : මාඉටිපේ අංක 2 පටුමග ද, දකුණට : එම ඉඩමේම ලොට් 13 බී 2 සහ ලොට් 13 බී 3 වශයෙන් ලකුණු කළ බිම් කොටස් ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් 13 ඒ වශයෙන් ලකුණු කළ කොටස ද, මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසිපහයි දශම දෙකක් (අක්. 0 රූඩ් 1 පර්. 25.2) වන ගාල්ල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 603/83 යටතේ ලියාපදිංචි කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටසය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

12-385/4

## මහජන බැංකුව – ඉබ්බාගමුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මාතලේ නගර ආසන්නයේ පල්ලේපොල, අලකොළඇල පිහිටි අකුරම්බොඩ ගෘප් *නොහොත්* මහවත්ත නමැති ඉඩමේ ලොට් අංක 02 දරන විශාලත්වය අක් 02, රූඩ් 00, පර්චස් 00ක් විශාල ඉඩම සහ ඊට අයිති සියළු දේත් මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.12.19 දින පෙ.ව. 10.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා .– රජයේ ගැසට් පත්‍රයේ* 1998.12.04 දින දිනමිණ පුවත්පතේ 1998.11.16 දින දී ඩේලි නිවුස් පුවත්පතේ 1998.11.16 දින ද තිනකරන් පුවත්පතේ 1998.11.16 දින දී ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීම් කෙරෙහි අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* ඉබ්බාගමුව සිට මැල්සිරිපුර දක්වා ගමන්කර මැල්සිරිපුරෙන් දකුණට ඇති මිල්ලවාන පාරේ සැ. 12ක් පමණ දුරින් පල්ලේපොල අකුරම්බොඩ ගමේ පිහිටි අකුරම්බොඩ වත්ත නමැති ඉඩම මෙම දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

13. ගැණුම් මිලෙන් 10%ක්,
14. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
15. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
16. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්
17. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
18. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල, විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 037 -22453,
ෆැක්ස් අංකය : 037 - 22838

හිමිකම් නම් වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනට මත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්.අයි. ගල්ලෑල්ල, (සාමවිනිසුරු),
උසාවි කොමසාරිස් බලයලත්
වෙන්දේසිකරු සහ තකසේරුකරු.

අංක 28. නව නීතිඥ සහ වෙළෙඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.
දුරකථන අංකය : 037 – 20062.

12-370

## රුහුණ සංවර්ධන බැංකුව–ගන්දර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

දෙවිනුවර පනන්සිල්ල පටුමගේ ගොඩනැගිලි සහිත වටිනා ඉඩමක් වෙන්දේසියේ විකිණීමයි. රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරා ඇති බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2006.12.28 දින පෙ.ව.10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් වෙන්දේසියේ විකුණනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ දෙවිනුවර බටහිර පනන්සිල්ල පටුමගේ වරිපනම් අංක 65 දරන ඉලංගකෝන් වත්තේ බෙදා වෙන් කරන ලද අංක 05 දරන පර්චස් අටයි දශම එකයි නවයක් (අ. 0, රූ. 0, පර්. 8.19) ක් විශාල ඉඩමේ සියලු වැවිලි හා පළතුරු සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි ද වේ. මෙම ඉඩම බලයලත් මිනින්දෝරු ජේ. ධර්මපාල මහතාගේ 1979.11.23 දින අංක 2377 පිඹුරේ පිළිබිඹු කර ඇත.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.01.04 දින ද, දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත්වල 2003.07.21 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.– දෙවිනුවර ධීවර වරායේ ගේට්ටුව අසලින් වම්පසට හැරී මීටර් 200 ක් පමණ ගමන් කළ පසු හමුවන තුංමංහන්දිය අසල මෙම දේපොළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :

01. ගැණුම් මිලෙන් 10% ක්,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
04. වෙන්දේසි වියදම් හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මාතර, පඹුරන, පිහිටි රුහුණ සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත ගිවිසගත් පරිදි දින 30 ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපොළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංකය : 041-2228731.

12-220

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කඩුවෙල ශාඛාව

### 1990 අංක දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා ලත් බලය මත පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේ දී 2006 දෙසැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, බත්තරමුල්ල උපකාර්යාලයේ, අංක 7 වසමේ දකුණු තලංගම, රොබට් ගුණවර්ධන මාවතේ, වරිපනම් අංක 331/ඒ දරන හේනේවත්ත සහ වත්තිආච්චියාවත්ත නැමැති ඉඩමට බලයලත් මානක එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1995.12.19 වැනි දින අංක 7624 දරණ පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 11ඒ දරන ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සියළු දේත් සමග හා 1998 මාර්තු මස 30 වැනි දින සහ අංක 21 දරන කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් ලියා සහතික කරන ලද උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සඳහන් ඉඩම මතින් පිහිටි මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය- පර්චස් 14, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 1998.03.30 සහ අංක 21 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අහංගම විතානගේ පද්මතිලක ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.06.09 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2006.06.13 වන දින ඩේලිනිව්ස්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක්,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500) ක් ද,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සී/ස. හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සඳහා විමසන්න:.

කළමණාකරු, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත,කොළඹ 10.

දුරකථන අංකය: 2661815, 2661816.

රංජිත් එස්. මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම),
උසාවි කොමසාරිස්. තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.

12-330

### මහජන බැංකුව - බදුල්ල මුතියංගණ ශාඛාව

බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ බදුලුපිටිය, වටරවුම් පාරේ වරිපනම් අංක 73 දරන ඉඩම ගොඩනැගිලි සහ පරිශ්‍රය ඇතුළු සැම සියලු දේත් වේ.

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම. මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.12.26 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිළිබඳ විස්තර.–* බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ බදුලු පිටියේ, වටරවුම් පාරේ, වරිපනම් අංක 73 යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර මහතා විසින් 1979 සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ සකස් කරන ලද පිඹුරු අංක 125 කැබලි අංක 04 ප්‍රමාණයෙන් පර්චස් 5.70 විශාල ඉඩම ගොඩනැගිලි සහ එහි තුළ පිහිටි සැම සියළු දේත් වේ.

*වැඩි විස්තර.* – 2006.06.09 දින රජයේ *ගැසට් පත්‍රයේ,* 2006.09.29 දිනමිණ, ඩේලිනිව්ස් හා තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ගය.–* බදුල්ල නගරයේ විල්ස්පාක් ක්‍රීඩාංගනය ඉදිරිපිට ඇති පාරේ යාර 150ක් ගමන් කර දකුණට හැරී බදුලුපිටිය පාරේ සැතපුම් කාලක් (සැ.1/4) පමණ ගමන් කර බදුලු පිටියේ, නිවාස සංකීර්ණයට පිවිසෙන පළමු පාරේ ටික දුරක් ගමන් කර වම්පසට ඩී. කොටසට පිවිසෙන මාර්ගය හමුවන අතර එම පාරේ මඳ දුරක් යන විට අයදුම්කරුවන් පදිංචි අංක සී/221 දරන ස්ථානයට පිවිසිය හැක. එය පාරට මායිම්ව දකුණු පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

01. ගැණුම් මිලෙන් 10%ක්,
02. පළාත් පාලන ආයතනයට 01%,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් 2 1/2%ක්,
04. ලිපිකරු සහ නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු ද වෙතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.
07. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව බදුල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ කළමනාකරු තුමා වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 055-2222165, 2223067, 2223068,
ෆැක්ස් අංකය : 055-2222361.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

ඉහත සඳහන් කරන පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සාමවිනිසුරු,
ඩබ්. ජයතිලක,
උසාවි කොමසාරිස්,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංකය : 055-2230846.

12-340

### ඩීඑෆ්සීසී බැංකුව
### (කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ අගනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### 4124 අංක දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ විස්තර

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය කොට්ඨාසයේ, යට්ටපාන ග්‍රාම නිලධාරී 843-බී කොට්ඨාසයේ යට්ටපාන ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර මහතා විසින් සාදන ලද 2004.01.26 දාතම හා අංක 182/2004 දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් දැනට නිරූපිත, මිනුම්පති විසින් සාදන ලද හා ඔහු භාරයේ පවතින අංක FVP III දරන පිඹුරේ නිරූපිත යට්ටපාන අදියර 1 නැමති ඉඩමේ මුලු භූමිය, පස හා එහි පිහිටි සැම සියලු දේද සමග ඉඩම ප්‍රමාණයෙන් අ. 3, රූ. 2, පර්චස් 0 එහි පිහිටි සැම සියලු දේද සමග.

1. "වෝකර්ස් 46.5" තනි ක්‍රියාකාරී ටී රෝලර් 2ක් 20HP මෝටරය හා ස්ටාටරය ද සමග,
2. "සිරකෝ 44" තනි ක්‍රියාකාරී ටී රෝලර් 2ක් 15HP මෝටරය හා ස්ටාටරයද සමග,
3. CCC34 තනි ක්‍රියාකාරී ටී රෝලර් 1ක් 15 HP මෝටරය හා ස්ටාටරය ද සමග
4. "2 x 14 3 -1/2" හා 1 x 14 4 - 1/2 අනුවැටුම් රෝල් බ්‍රේකර් 3ක් මෝටරය හා ස්ටාටරය ද සමග
5. "සිරකෝ " වියලන 1ක් අවශ්‍ය සියලුම උපාංග ද සමග
6. "මහේන්ද්‍ර" අඩි 6ක වියලනය මෝටරය හා ස්ටාටරය ද සමග
7. "PPPJ" ඉලෙක්ට්‍රොනික සංකු නිස්කාරක 2ක් මෝටරය හා ස්ටාටරය ද සමග,
8. "PPPJ" චූෂණ විනොවරය මෝටරය හා ස්ටාටරය ද සමග,
9. "PPPJ" මිඩ්ල්ටන් සිෆ්ටරය මෝටරය හා ස්ටාටරය ද සමග,
10. "PPPJ" මිච්ගන් සිෆ්ටර 3ක් මෝටරය හා ස්ටාටරය ද සමග,
11. "PPPJ" වෝටා සිෆ්ටරය මෝටරය හා ස්ටාටරය ද සමග,
12. තේ අසුරනයක් මෝටරය හා ස්ටාටරය ද සමග,
13. සෙන්වෙක් වර්ණ වෙන්කිරීමේ උපකරණය (C-7000W) නවතම අංක 041770 එයාර් කොම්ප්‍රෙසරය හා මෝටරය ද සමග,
14. සෙන්වෙක් වර්ණ වෙන්කිරීමේ උපකරණය (C-8000W) නවතම අංක 132762 එයාර් කොම්ප්‍රෙසරය හා මෝටරය ද සමග,
15. ටී බ්ලෝවරය මෝටරය ද සමග,
16. ටැරි නිපරයක් මෝටරය ද සමග,
17. විදුරින් ද්‍රෝණිකා 7ක්, ප්‍රමාණය 85 x 6 සහ 95 x 6, 2 x2GI වෙලඩින් දැල හා නයිලෝන් නිවිං සහිතව ස්ප්‍රෙඩින් බෙඩ් 48 එයාර් ඉන්පුට් යුනිට් C/W 7.5 HP මෝටර්,
18. ඉන්දියාවේ නිෂ්පාදිත හියුමිඩිෆයර්ස් 2ක් මෝටරයද සමග ඉහත සඳහන් සවිකළ කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ එම භූමිය තුළම ඇත.

8 වන වීදිය සිංහරාජ උද්‍යානය, යට්ටපාතහි පදිංචි හිරියමුල්ල විතානගේ සුමිත් ගාමිණී කරුණාරත්න, හිරියමුල්ල විතානගේ චන්දන කුමාර සහ හිරියමුල්ල විතානගේ නිමාලාවතී යන අය විසින් ගෙන යන 8 වන වීදිය, සිංහරාජ උද්‍යානය, යට්ටපාතහි පිහිටි හවුල් ව්‍යාපාරය වන යට්ටපාත තේ කම්හල විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලද ණය අංක 4124 දරන 2004 මාර්තු 01 වන දින හා මාතර සුප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වී. ද සිල්වා මහතා විසින් සහතික කළ 2006 දෙසැම්බර් මස 28 වන බ්‍රහස්පතින්දා පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිල තීන්දු වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි),
4. රු. 22,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු 500යි,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000යි.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද, සමග අදාළ පරිදි වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න.

දුරකථන අංකය : 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,<br>
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී,<br>
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

| | |
|---|---|
| *ප්‍රධාන කාර්යාලය* : | *නගර කාර්යාලය* : |
| අංක 24, | අංක 290, |
| ටොරින්ටන් පාර, | හැව්ලොක් පාර, |
| මහනුවර. | කොළඹ 05. |
| දුරකථන අංකය : 081-2227593 | දුරකථන : 2585408, 2502680 |
| දුරකථන/ෆැක්ස් : 081-2224371 | දුරකථන/ෆැක්ස් : 2588176 |
| | ඊ මේල් : samera@sri.lanka.net |

12-389

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේ ගම්පහ කෝරළේ වත්තේගම පිහිටි කොළඹ බලයලත් මිනින්දෝරු සී. වී. ඒ. විතාරණ විසින් සාදන ලද වර්ෂ 2001 පෙබරවාරි මස 09 වැනි දිනැති අංක 2022 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දක්වා ඇති අතලාහගොඩපිටියේ වත්ත සහ ඉඹුලාවල මැදවලව්වේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමින් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 01 දරන ඉඩම් කැබැල්ලට මායිම් වයඹට : ලොට් 02 ද, ඊසානට : අතලාහගොඩ පටුමග ද, නිරිතට : ලොට් 02 ද, සහ ගිණිකොණට : ලොට් 02 ද, වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඊ 763/203 හි ලියාපදිංචි කොට ඇත.

ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 35.3 එහි පිහිටි ගොඩනැගිලි සහ සියලුම දේ සමග වූ ඉඩම අංක 2022 දරන පිඹුරේ එකී ලොට් 1 මෙහි පහත දැක්වෙන ඉඩමේ කොටසක් වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ කෝරළේ වත්තේගම පිහිටි බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් සාදන ලද වර්ෂ 1991ක් වූ අගෝස්තු මස17 වැනි දිනැති අංක 938 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන අතලාහගොඩපිටියේ වත්ත සහ ඉඹුලාවල මැදවලව්වේවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටස් එකිනෙකට ඒකාබද්ධ කොට එක් දේපළක් වශයෙන් වූ බෙදා වෙන් කර ඇති ඉඩම් කොටස, එකී ලොට් 01 දරන කැබැල්ලට මායිම් - ඊසානට : අටලහගොඩගේන ද, නැගෙනහිරට : බෝගහමුල්ල මුදුන ද, දකුණට : පංගොල්ලේ වත්ත සහ තොටුවත්ත සහ බස්නාහිරට : සහ වයඹට : යටිරාවන සිට එන අඩිපාර ද ප්‍රමාණයෙන් අ. 1 රූ. 1 පර්. 35.5 වන එකී 938 දරන පිඹුර ප්‍රකාරව එහි පිහිටි ගොඩනැගිලි සහ සියළුම දේ සමග වූ ඉඩම. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත් ඉරු ඊ 625/82 හි ලියාපදිංචි වී ඇත.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් චේතිය පද්මසිරි සුහසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නමට ලියන ලද්දාවූ ද 2004 දෙසැම්බර් මස 23 දිනැති අංක 2134 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පිළියන්දල, කුම්බෝවිල, ආසිරි පෙදෙස, අංක 55/6 දරන ස්ථානයේ පදිංචි නිරූපිකා ක්‍රිස්ටලින් පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් පැහැරහැර ඇති හෙයින් සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2007ක් වූ ජනවාරි මස 11 වන දින පෙ. ව. 11.00 ට ඉහත සඳහන් දේපළ අප විසින් එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.11.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද*, 2006.08.01 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*දේපලට පිවිසීම.–* වත්තේගම නගරයේ සිට නුවර පාරේ මීටර් 200ක් පමණ ගමන් කළ විට වමට ඇති අටලහගොඩ පාරට හැරී තවත් මීටර් 300 පමණ ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.–* විකිණීම ස්ථිර කළ වහාම සර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය :

(1) ගැණුම් මිලෙන් සියයට දහක් (10%),
(2) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30ක් තුළ දී සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
(3) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(4) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
(5) බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම්,
(6) ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
(7) නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු-නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකථන අංකය : 011-4313131.

ත්‍රිවංක සහ සේනානායක,
වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු

අංක 182,
පළමු මහළ, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2388318.

12-392

---

## සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම

කොටුගොඩ, කුරුඳුවත්ත, ඒකළ පිහිටි බලයලත් මානක එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2001 ක් වූ ජනවාරි මස 22 වැනි දිනැති අංක 1819 දරන පිඹුරේ ලොට් කේ 10 වශයෙන් බෙදා වෙන් කොට සළකුණු කොට දැක්වෙන ඕටීඑස් ඉඩම (OTS IDAMA) එකී ලොට් කේ 10 දරන කැබැල්ලට මායිම් - උතුරට : මෙහි ආර් 74 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2000ක් වූ නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 1816 දරන පිඹුරේ ලොට් ජේ ද, දකුණට : මෙහි ලොට් ආර් 75 ද, බස්නාහිරට : මෙහි ලොට් කේ 9 ද වන ප්‍රමාණයෙන් පර්චස් හයක් සහ දශම නමයයි හයක් ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 6.96 (හෝ එකී අංක 1819 දරන පිඹුර ප්‍රකාරව වර්ග මීටර 1,76,000ක් වන ඉඩම් කොටස එහි පිහිටි ගහකොළ, පළතුරු සහ සියළුම දේ සමග).

මෙහි පහත දැක්වෙන මාර්ග රක්ෂිතය ඔස්සේ හෝ ඒ මතින් බර පැටවූ හෝ නොපැටවූ වාහන ඇතිව හෝ නැතිව යෑමට ඒමට සහ පසු කර යෑමටත් මෙහි එකී ගැනුම්කරුගේ හා ඔහුගේ පූර්වෝක්තයන්ගේ පාවිච්චි සහ ප්‍රයෝජන පිණිස එකී මාර්ගය ඔස්සේ හෝ ඒ මතින් ප්‍රධාන ජලාපවහන සහ ජල සම්පාදන නළ, විදුලි රැහැන් හා උඩින් කම්බි සහ වෙනත් උපකරණ යෙදීමට සහ ඉදිකිරීමටත් ඉහත විස්තර කර ඇති පරිශ්‍රය බුක්ති විඳීමට සම්බන්ධ සියලුම කාරණාවන් සඳහා පූර්ණ නිදහස අයිතිය සහ මුක්තිය සහ අවසරය ප්‍රදානය කෙරෙන නමුත් එම අයිතිය බුක්ති විඳීමේදී එවැනි අයිතීන්ට හිමිකම් ඇති සෙස්සන්ගේ අයිතිවාසිකම්වලට බාධාවක් කවර ආකාරයකින් හෝ අන්දමකින් සිදු නොවිය යුතුය.

1. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2000ක් වූ නොවැම්බර් මස 15 වැනි දිනැති අංක 1816 දරන පිඹුර ප්‍රකාරව එහි දැක්වෙන ලොට් ආර් 2 සහ ආර් 3.

2. බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද වර්ෂ 2001ක් වූ ජනවාරි මස 22 වැනි දිනැති අංක 1819 දරන පිඹුර ප්‍රකාරව එහි දැක්වෙන ලොට් ආර් 74 සහ ආර් 75 (සේවා ප්‍රදේශය).

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව නමට ලියන ලද්දාවූ ද 2002 ජූලි මස 30 වැනි දිනැති අංක 2874 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම බොරලැස්ගමුව, කටුවාවල කැපිටල් සිටි, අංක 137/7 (අනෙක් ලිපිනය බොරලැස්ගමුව, කටුවාවල කැපිටල් සිටි, අංක 130/7) ජයසිරි අනුර විතානගේ සහ දෝන තේජා කුමුදිනී විතානගේ යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2007ක් වූ ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 10.00 ට ඉහත සඳහන් දේපළ අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.11.10 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2006.08.01 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසීම.*– ජාඇල නගර මධ්‍යයේ සිට මිනුවන්ගොඩ පාරේ සැතැප්ම 4 පමණ ගමන් කළ විට ගුවන් හමුදා කඳවුර අසලින් වමට ඇති උත්තමාරාම පාරට (ඕටීඑස් ඉඩම පාර) හැරී හැතැප්ම 3/4 පමණ ගමන් කළ විට නිවාසිපුර නිවාස ක්‍රමය දකුණු පසින් හමු වේ. අදාළ ඉඩම මෙම පාරේ සිට යාර 100ක් පමණ දුරින් පිහිටා ඇති අතර අඩි 40 පමණ පාරකින් ඉඩමට ප්‍රවේශ විය හැක.

*ගෙවීම් කළ යුතු ආකාරය.*– විකිණීම ස්ථිර කළ වහාම සර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(2) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
(3) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(4) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
(5) බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම්,
(6) ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
(7) නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු-නීති, සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන අංකය : 011-4313131.

ත්‍රිවංක සහ සේනානායක, වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182,
පළමු මහළ, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2388318.

12-391

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

සංශෝධිතව වූ පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

### ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අයත් වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේපත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල පිහිටි නාගහවත්ත යන ඉඩමේ පර්චස් 10 ක විශාලත්වය ඇති සළකුණු කරන ලද ලොට් අංක 1 බී 3 නමැති වටිනා බිම් කොටස වෙන්දේසියේ විකිණීම

*දේපළ පිළිබඳ විස්තර*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සලාපිටි කෝරලේ, පල්ලේපත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල පිහිටි නාගහවත්ත යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. ජී. ඩී. වීරසිංහ විසින් මැන සාදන ලද 1995.08.30 දිනැති අංක 3236 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන පර්චස් 10 ( අක්. 0 රූ. 0 පර්. 10) හෝ හෙක්ටයාර 0.02 253 විශාලත්වය ඇති ලොට් අංක 1 B3 නමැති ඉඩමට මායිම්- උතුරට : ලොට් අංක 1 B2 හා 1B4 අඩි 6 ක් පළල මාර්ගයක් සඳහා වෙන් කළ බිම් කට්ටියද, නැගෙනහිරට : අංක 2845 දරන පිඹුරේ ලොට් අංක 1C ද, දකුණට : දෙල්ගහවත්ත ද සහ බටහිරට : ලොට් අංක 1 B4 අඩි 6 ක් පළල මාර්ගයක් සඳහා වෙන් කළ බිම් කට්ටිය හා අංක 3235 දරන පිඹුරේ ලොට් අංක 1**A**3 යන මායිම් ඇතුළත පිහිටි ගස් හා වගාවන් ඇතුළු සියලු දේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ **M** 2100/263 යටත් ලියාපදිංචි කර ඇත.

*දේපළට ළඟාවීම.*– මහරගම නගරයේ සිට දෙහිවල මාර්ගයේ මීටර් 750 ක් පමණ ඉදිරියට පැමිණ වමට හැරී කටුවාවල මාර්ගයට පිවිස කිලෝමීටර් 2.5 ක් පමණ ඉදිරියට පැමිණි විට මාර්ගයේ වම් පසින් ගල්වර පාර මුණගැසෙනු ඇත. ඒ අනුව වමට හැරී ඉහත පාරට පිවිස මීටර් 200 ක් පමණ ඉදිරියට පැමිණ කඩයට මෙහායින් දකුණු පස ඇති මීටර් 4 ක් පළල පෞද්ගලික මාර්ගයට හැරී මීටර් 75 ක් පමණ ඉදිරියට පැමිණි විට මාර්ගයේ වම්පසින් පිහිටා ඇති යථෝක්ත දේපළට පිවිසිය හැකිය.

2007 ජනවාරි 31 වන දින පෙ. ව. 11.00 ට ඇරඹීමට නියමිත ප්‍රසිද්ධ වෙන්දේසියේ දී මෙම දේපළත් ඊට අයත් සියලු දේත් එම ස්ථානයේදීම විකිණෙනු ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– අවසන් ලන්සුව තීරණය වීමත් සමග සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 25% ක්,
2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බදු මුදල ලෙස,
3. ගැණුම් මිලෙන් 2 1/2% ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස,
4. සම්පූර්ණ ප්‍රචාරක වියදම ලෙස රු. 45,500 ක්,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු ලෙස රු. 500 ක්,
6. විකිණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු ලෙස රු. 3,000 ක්.

ගැණුම් මිලෙන් 75% ක් වන ඉතිරි මුදල වෙන්දේසි දින සිට දින 30 ක් තුළ බැංකුවට ගෙවිය යුතුය.

විකිණුම් කොන්දේසි හා වෙනත් විස්තර සඳහා කරුණාකර සහකාර සාමාන්‍යාධිකාරි (ණය), ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

දූරකථන අංකය : 011-2576132 අමතන්න.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ සියලුම බැංකු සඳහා ප්‍රසිද්ධ පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවන් හා තක්සේරුකරුවන්

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාර :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දූරකථන අංක : 081 - 2224371
081-2227593
ෆැක්ස් : 081 2224371
ඊ-මේල් : sameera@diamond.lanka.net

*නගර කාර්යාලය :*
අංක 55ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03
දූරකථන අංක :011 - 2448526
011-2441761
ෆැක්ස් : 011-2448526
ඊ-මේල් : sameera@sirilanka.net

12-347